# හින්දි භාෂක කලාපයේ උපභාෂා පිළිබඳ අධ්‍යයනයක්

උපුල් රංජිත් හේවාවිතානගමගේ

Hindi, the official language of India, is spoken about 42.9% of the population of that country. It has many regional and social dialects. The purpose of this article is to give a brief account of Hindi regional dialects including their sub-dialects. Relevant dialect maps and statistics are also given.

0.1 නූතන ඉන්දු ආර්ය භාෂාවන් අතර පුළුල් ව්‍යාප්තියක් ඇති භාෂාව ලෙස ගැනෙන්නේ හින්දි භාෂාව ය. එය වර්තමාන භාරතයේ රාජ්‍ය භාෂාව ලෙස පිළිගැනේ. භාරතයේ මුළු භූමි ප්‍රමාණයෙන් 42%ක භූමි ප්‍රමාණයක පැතිරී තිබෙන සහ එහි මුළු ජනගහණයෙන් 42.9%ක් ජනතාව කථා කරන හින්දි භාෂාව අප රටෙහි මෙන්ම ලොව පුරාම ජනප්‍රිය භාෂාවක් ලෙස ද සැලකේ. මෙම ලිපියෙන් සලකා බැලෙන්නේ හින්දි භාෂාව හා සම්බන්ධ උපභාෂා මොනවාද? ඒවා කුමන ප්‍රදේශවල ප්‍රචලිත වී ඇත්ද ? යන කරුණු පිළිබඳව ය.

0.2 උත්තර් ප්‍රදේශ්, මධ්‍ය ප්‍රදේශ්, රාජස්ථාන්, දිල්ලි, බිහාර්, චණ්ඩිගඪ් සහ හිමාචල් ප්‍රදේශ් හි විශාල කොටසක්, පූර්ව පංජාබ් හි නැගෙනහිර යන කොටස් ඇතුළත් භූමිභාගය 'හින්දි ක්ෂේත්‍ර' හෙවත් 'හින්දි භාෂක කලාපය'* ලෙස ගැනේ.[1] මේ සම්බන්ධයෙන් වෙනත් මත ද තිබේ.[2] ඉහත කී භූමිභාගයෙහි ප්‍රචලිත උර්දු භාෂාව හැර අනෙක් සියලුම උපභාෂාවන් හින්දි ගණයේලා සැලකෙන අතර, ඒ සියලු උපභාෂාවන් වර්තමානයේ හැඳින්වෙන්නේ 'හින්දි' යන පොදු නාමයෙනි.[3]

---

* බලන්න භාවිත ශබ්ද සංකේත පි. 157

* සිතියම් බලන්න, පි. 156

1 තිවාරි, ඩො. භෝලානාථ්, හින්දි භාෂා, පි. 135, 140

2 වර්මා, ඩො. ධීරේන්ද්‍ර, හින්දි භාෂා කා ඉතිහාස්, පි. 63-69

3 හින්දියේ කලාපීය උපභාෂා, ප්‍රාදේශීය උපභාෂා ('බෝලියා') . ග්‍රාමීය උපභාෂා (උපබෝලියා) යනුවෙන් උපභාෂා වර්ග තිබේයයි. එමෙන්ම ග්‍රාමීය උපභාෂාවල ස්ථාන විශේෂ හා (ජන)වර්ග විශේෂ උපභාෂා (උපබෝලියා) ද දක්නට ඇත.